ජපන් තානාපති කාර්යාලය

අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථක : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp

## පුවත්පත් නිවේදනය

පෙබරවාරි 8, 2013

# උතුරේ බිම් බෝම්බ ඉවත්කිරීමේ කටයුතු සඳහා ජපන් රජයෙන් ඇමරිකානු ඩොලර් 860,500 ආධාර

ජපන් රජය විසින්, උතුරේ බිම් බෝම්බ ඉවත්කර ශ්‍රී ලංකාව බිම් බෝම්බ වලින් තොර දේශයක් ගොඩනැගීමේ අරමුණින් ඩොලර් 860,500 (දළ වශයෙන් රුපියල් මිලියන 107 ක) ආධාරයක් 'හේලෝ ට්‍රස්ට්' ( the HALO Trust ) ආයතනයට ප්‍රධානය කරන ලදි.

ලෝක සාමය සහ සෞභාග්‍යය වෙනුවෙන් කැපවුනු ජාතියක් ලෙස ශ්‍රී ලංකාවේ සාමයත් ප්‍රතිසංස්කරණයත් මධ්‍ය හා දීර්ඝකාලින ව්‍යාපෘති උදෙසා බිම් බෝම්බ ඉවත්කිරීම වෙනුවෙන් ජපන් රජය ප්‍රධානතම ආධාර සපයන රට ලෙස සහයෝගය ලබා දෙන්නේ අවතැන් වුවන් ඉක්මනින්ම පදිංචි කර කෘෂිකාර්මික සහ වෙනත් ජෘවනෝපායන් සඳහා අවකාශය ලබාදීමටය.

ජපන් රජය විසින් උතුරු නැගෙනහිර බිම් බෝම්බ ඉවත්කිරීම සඳහා 2003 වසරේ සිට මේ දක්වා ඩොලර් මිලියන 24 (දළ වශයෙන් රුපියල් මිලියන 3,025 ) ක පමණ ආධාර බිම් මට්ටමේ මානව සුරැකීමේ ආධාර ව්‍යාපෘතිය (GGP) යටතේ ලබාදී ඇත. මෙම ආධාර තුලින් බිම් මට්ටමේ ප්‍රජාවගේ ආරක්ෂාව සාක්ෂාත් කරගැනීම සඳහා පිටුවහලක් වනු ඇතැයි යන්න ජපන් රජයේ ඒකායන බලාපොරොත්තුවයි.

‘හේලෝ ට්‍රස්ට්’ ( the HALO Trust ) ආයතනයේ වැඩ සටහන් කළමණාකාර බාර්තලොම්ව් ඩිග්බි මහතා පැවසුයේ ‘හේලෝ ට්‍රස්ට්’ ආයතනය 2002 වසරේ සිට යාපනය කිලිනොච්චි ත්‍රිකුණාමලය සහ මුලතිව් දිස්ත්‍රික්ක වල බිම් බෝම්බ ඉවත් කිරීම සඳහා රජයට සහයෝලය ලබාදුන් බවය. තම්වන විට බිම්බෝම්බ ඉවත් කරන කණ්ඩායමේ 1000 කට වඩා පිරිමි සහ කාන්තාවන් සිටින බවත් 2013 දී ජපන් රජයේ අධාර ඇතිව බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලියේ 10 වන වසර වන බවත් ජපන් ආධාර ඇතිව මේ වන විට හෙක්ටයාර් 660කට වඩා ප්‍රමාණයක බිම් බෝම්බ ඉවත් කර ඇති බවද ඔහු පැවසීය. එමෙන්ම ඒ හරහා 23,000 කට වඩා බිම් බෝම්බ ඉවත් කල බවත් ඉන් 1400ක් පුපුරා නොගිය ඒවා බවත් ඔහු පැවසු අතර යුද්ධයෙන් අවතැන් වු දස දහසක වඩා පිරිසක් නැවත පදංචි කිරීමට හැකිවු බවද පැවසු ඔහු තව දුරටත් කිවේ බිම් බෝම්බ ඉවත් කිරීමෙන් අනතුරුව එම ප්‍රදේශ වල පාරවල් වැව් පාසැල් වැඩි යටිතල පහසුකම් ද වැඩි දියුණු වු බවය. ජපන් රජය විසින් බිම් බෝම්බ ඉවත්කිරීම සඳහා නොකඩවා අධාර සැපයීම වෙනුවෙන් ‘හේලෝ ට්‍රස්ට්’ ආයතනයේ කෘතඥපූර්වක ස්තුතිය පිරිනැමීය.

.

බිම් බෝම්බ ඉවත් කිරීමට ලබාදුන් ආධාර වලට අමතරව ජපන් රජය මගින් උතුරේ සංවර්ධනය සඳහා විවිධ වු ව්‍යාපෘති ගණනාවක් වෙනුවෙන් මේ වන විට ආධාර උපකාර ලබාදී ඇත. බිම් බෝම්බ ඉවත්කිරීම, යාපනය ශික්ෂණ රෝහල වැඩි දියුණු කිරීම, වව්නියා කිලිනොච්චි සම්ප්‍රේෂණ පද්ධති ගොඩනැගීම, යාපනයේ සහ මන්නාරම දිස්ත්‍රික්කයන්හි ජනතාව නැවත පදිංචි කරවීම, ඩිජිටල් භූවිෂමතා සිතියම්ගත කිරීම සහ රජයේ ඉදිරිපෙල නිලධාරීන් පුහුණුකිරීම සඳහා සහයෝගය ලබාදීම ඉන් සමහරක් වේ. මෙම ආධාර තුලින් ශ්‍රී ලාංකීය ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීමටත්, ඔවුන්ගේ ජිවන තත්වයන් නගා සිටුවීමටත්, තිරසාර සාමය සහ සංවර්ධනය වෙනුවෙන් දායකත්වය ලබාදීමටත් හැකිවනු ඇතැයි යන්න ජපන් රජයේ අපේක්ෂාවයි.

ජපන් තානාපති නොබුහිතෝ හොබෝ මහතාත් ‘හේලෝ ට්‍රස්ට්’ ( the HALO Trust ) ආයතනයේ වැඩ සටහන් කළමණාකාර බාර්තලොම්ව් ඩිග්බි මහතාත් අතර, 2013 පෙබරවාරි මස 8 වන දින තානාපති නිල නිවසේදී මෙම ආධාර ගිවිසුම අත්සන් කරන ලදී.

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න
ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලයය
දුරකථන 011-2693831 දිගු අංකය 225
ඊ මේල් : cultujpn@co.mofa.go.jp